**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල**

**10 ශ්‍රේණිය　　　　භූගෝල විද්‍යාව　　　　සැප්තැම්බර් 5 සතිය**

**නිපුණතාව ඃ-** භෞතික හා මානුෂ ක්‍රියාවලින්ගේ අන්තර් ක්‍රියා භෞතික හා මානුෂ පරිසරය කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි.

**නිපුණතා මට්ටම ඃ-** ලෝකයේ නිෂ්පාදන කර්මාන්තවල ව්‍යාප්තිය, ලක්ෂණ හා ගැටලු පැහැදිලි කරයි.

**මෙම පාඩම තුළින් ලබා ගත හැකි ඉගෙනුම් පල ඃ-**

* නිෂ්පාදන කර්මාන්ත අර්ථ දක්වයි.
* නිෂ්පාදන කර්මාන්ත කිහිපයක ව්‍යාප්තිය ලෝක ආකෘති සිතියමක ළකුණු කරයි.
* නිෂ්පාදන කර්මාන්තවල ලක්ෂණ පැහැදිලි කරයි.
* නිෂ්පාදන කර්මාන්තවල ප්‍රවණතා පැහැදිලි කරයි.
* ලෝකයේ නිෂ්පාදන කර්මාන්ත හා සම්බන්ධ පොදු ගැටළු සාකච්ඡා කරයි.

**පාඩම ඃ-** නිෂ්පාදන කර්මාන්ත - ලෝක නිෂ්පාදන කර්මාන්ත ආශ්‍රිත ගැටලු

**ශිෂ්‍යයා කළ යුතු කාර්යයන් ඃ-**

10 ශ්‍රේණිය භූගෝල විද්‍යාව පෙළ පොතෙහි පිටු අංක 109 සිට 111 තෙක් හා පහත සටහනද කියවා ලබා දී ඇති ක්‍රියාකාරකම් කරන්න. පහත ගැටළු සඳහා උදාහරණ මෑතකාලීන පුවත්පත්, සඟරා ආදියෙන් සොයා ගැනීමට උත්සාහ ගන්න.

- මිනිස් අවශ්‍යතා සපුරාගැනීම සඳහා ලෝකයේ නිෂ්පාදන කර්මාන්ත විශාල දායකත්වයක් ලබා දුන්නද, සමස්ත පෘථිවියට ගැටළු රැසක් නිර්මාණය වීමට ද හේතු වී ඇත.
- නිෂ්පාදන කර්මාන්ත ඇසුරින් පැන නැගී ඇති ගැටළු ක්ෂේත්‍ර හතක් ඔස්සේ හඳුනා ගත හැකිය.
  * අමුද්‍රව්‍ය ආශ්‍රිත ගැටළු
  * ශ්‍රමය ආශ්‍රිත ගැටළු
  * පාරිසරික ගැටළු
  * සමාජ, ආර්ථික හා සංස්කෘතික ගැටළු
  * වෙළෙඳපළ ආශ්‍රිත ගැටළු
  * බලශක්තිය ආශ්‍රිත ගැටළු
  * ප්‍රාග්ධනය ආශ්‍රිත ගැටළු

**ක්‍රියාකාරකම**

01. පහත ක්ෂේත්‍රයන් හා සම්බන්ධ ගැටලු දෙක බැගින් දක්වා පහත වගුව සම්පූර්ණ කරන්න.

| ක්ෂේත්‍රය | ගැටලු |
|---|---|
| අමුද්‍රව්‍ය | *<br>* |
| ශ්‍රමය | *<br>* |
| පාරිසරික | *<br>* |
| සමාජ, ආර්ථික හා සංස්කෘතික | *<br>* |
| වෙළඳපල | *<br>* |
| බලශක්තිය | *<br>* |
| ප්‍රාග්ධනය | *<br>* |

02. නිෂ්පාදන කර්මාන්ත ආශ්‍රිතව පැන නැගී ඇති පාරිසරික ගැටලු අවම කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග තුනක් උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

03. නිෂ්පාදන කර්මාන්ත ආශ්‍රිතව පැන නැගී ඇති සමාජ, ආර්ථික හා සංස්කෘතික ගැටලු තුනක් ලියා එකක් පැහැදිලි කරන්න.

**ඉහත ක්‍රියාකාරකම් සඳහා උපයෝගී කරගත හැකි පොත්පත් හා ඉගෙනුම් ආධාරක ඃ-**

- මානුෂ භූගෝල විද්‍යාව, දෙවන කොටස (2009), අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ.
- e නැණ පියස - (enenapiyasa.lk)
- හොරණ කලාප අධ්‍යාපන කාර්යාලය - සවියනේ පෙරට යූ ටියුබ් නාලිකාව https://www.saviyenperata.com/